**අම්පාර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 29 - 2022**

**-----------------------------------------------------------------------**

## 1. විගණන මතය

1.1 අම්පාර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 29 ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2022 වර්ෂයට අදාළව අම්පාර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 29 ට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම කාරක සභා 29 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 25කට අදාළව මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ අඩංගු විය යුතු සංරචකයක් වන ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සමඟ ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | සියලුම සංරචක ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභාව වෙත ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව හා අනෙකුත් ආයතන විසින් ලබා දී තිබුණ ස්ථාවර වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | තක්සේරු වටිනාකම් ලබා ගනිමින් ගිණුම්ගත කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේදී වේනකුඩිරිප්පු ගොවිජන සේවා කාරක සභාව විසින් ඉදිකරන ලද කාර්යාල ගොඩනැගිල්ල හා වැසිකිළියේ සහ නින්දවූර් ගොවිජන සේවා කාරක සභාව විසින් ඉදිකරන ලද රැස්වීම් ශාලාවේ මුළු වටිනාකම වන එකතුව රු.3,118,092 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරමි. | මෙම වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවිජන කාරක සභා 06කට අදාළව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ලැබිය යුතු අක්කර බදු රු.1,413,868 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2015 සිට 2021 දක්වා ලැබිය යුතු අක්කර බදු මුදල වන රු.88,618 ක් ගිණුම්ගත කර ඇත. | ලැබිය යුතු මුළු අක්කර බදු මුදල නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 06කට අදාළව කාර්යාල ගොඩනැගිල්ලෙහි තීන්ත ආලේප කිරීම, තිර රෙදි මිලදීගැනීම, පරිගණක අලුත්වැඩියා කිරීමේ පිරිවැය හා අලි වැටක් ඉදිකිරීම යනාදී අයභාර වියදම් එකතුව රු.530,207 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | තීන්ත ආලේප කිරීම සඳහා වියදම් කරන ලද රු.24,290 ඉදිරි වර්ෂයේ දී නිවැරදිව ගිණුම්ගත කරමි. | මෙම වටිනාකම අයභාර වියදම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 03ක් විසින් වර්ෂ 03 සිට වර්ෂ 17 දක්වා ගෙවිය යුතු විගණන ගාස්තු එකතුව රු.149,200 ක් උපචිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කරමි. | ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | කාරක සභා 02කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ වර්ගයේ කාබනික පෙහොර හා MOP පොහොර තොගයේ වටිනාකම රු.269,591 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | වර්ෂ අවසාන දිනට තොග වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | කාර්තිවු ගොවිජන සේවා කාරක සභාවේ ජංගම හා ජංගම නොවන වත්කම් වල මුළු වටිනාකම රු.8,461,122 ක් වුවද රු.4,520,521 ක් ලෙස රු.3,940,601 ක් අඩුවෙන් ගණනය කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදිව වටිනාකම් ගණනය කළ යුතුය. |
| (ඌ) | උහන ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම වන රු.432,500 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වාර්තා සකස් කිරීමේදී නිවැරදිව ගිණුම්ගත කරමි. | උපචිත පදනම මත ගිණුම්ගත කිරීමේදී වර්ෂයට අදාළ පොලී ආදායම ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.279,536කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරමි. | වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු වටිනාකම පමණක් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂය තුළ කාරක සභා ගොඩනැගිල්ලෙහි තීන්ත ආලේප කිරීමේ වියදම රු.229,330 ක් අයභාර වියදමක් ලෙස හඳුනා නොගෙන ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරමි. | තීන්ත ආලේප කිරීමේ වියදම අයභාර වියදමක් ලෙස හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ගොවිජන සේවා කොමසාරිස් විසින් හිඟුරාණ ගොවිජන සේවා කාරක සභාව වෙත ලබා දී ඇති කුබෝටා ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් වෙන්දේසි කර තිබුණ ද අදාළ ට්‍රැක්ටර් රථය වෙනුවෙන් ගෙවිය යුතු ලෙස ගොවිජන සේවා කොමසාරිස් නමින් රු.644,020 ක් මුදලක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වාර්තා මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | සමාලෝචිත වර්ෂය අවසාන දිනට අදාළ ට්‍රැක්ටර් රථය වෙනුවෙන් ගෙවිය යුතු ලෙස දක්වා ඇති ගිණුම පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | 2007 දෙසැම්බර් 31 දිනට බැංකු විස්තරය අනුව ශේෂය මුදල් පොතේ ශේෂය අනුව වෙනස යනුවෙන් රු.1,341,107 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවි බැංකුවෙහි ශේෂ පත්‍රය තුළ දක්වා තිබුණ ද එම වෙනසට හේතු හඳුනා ගනිමින් එය නිරවුල් කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ශේෂ පත්‍රයේ වෙනසට හේතු හෙළිදරව් කරගනිමින් එම අගය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ක) | බඩ ඉරිඟු වගාව සඳහා අලෙවි කිරීම වෙනුවෙන් මිලදී ගන්නා ලද යූරියා පොහොර තොගයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග වටිනාකම, වෙළඳ ගිණුම හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ රු.488,961 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට නිවැරදි තොග වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 08කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් අයිතම 34 ක අනුරූපී වාර්තා ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන ශේෂයන් අතර රු.8,394,518ක වෙනස්කමක් නිරීක්ෂණය විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නොසැසඳීම්වලට හේතූන් පරීක්ෂා කර කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල<br><br><br>රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 05කට අදාළ මූල්‍ය ප්‍රකාශනයන්හි 2012 වර්ෂයේ සිට | 1,383,263 | අවුරුදු 06 සිට 12 | ඉදිරි ගිණුම් වාර්තාවලින් | අවිනිශ්චිත ගිණුමේ අදාළ |

| | | |
|---|---|---|
| 2022 වර්ෂය දක්වා කාල පරාසයක් තුළ අවිනිශ්චිත ගිණුම් ශේෂ 08ක් නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දක්වා නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගනුදෙනු හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

**1.3.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 08 ක අදාළ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.95,987,037 ක වත්කම් හා වගකීම් ශේෂ සඳහා සාක්ෂි හා තොරතුරු නොමැති වීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මෙම ශේෂයන් සනාථ කර ගතහැකි කිසිදු ලේඛණයක් කාර්යාලය තුලනොමැතිවීම හේතුවෙන් විගණනය සඳහා ඉදිරිපත් කර ගැනීමට නොහැකි විය. ලිඛිත සාක්ෂි සොයා ගැනීමට කටයුතු කරමින් සිටී. ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ගොවිජන නියෝජ්‍ය කොමසාරිස් වෙත ලිපි යවා ඇත.පිළිතුරු ලිපි සහ නිවැරදි උපදෙස් ලැබුණු පසු එම ශේෂ ඉවත් කිරීමට කටයුතු කරමි. | අදාළ වත්කම් හා වගකීම් ගිණුම් ශේෂ තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි හා තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.4 නීතී, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීතී, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත<br>-------------------- | | | |
| (i) | 32 හා 33 වගන්ති | අඬ්ඩාලච්චේන ගොවිජන සේවා බල ප්‍රදේශයේ අනවසරයෙන් ගොඩකරන ලද කුඹුරු ඉඩම් අක්කර 32 ක් අතරින් නැවත වගා කිරීමට අධිකරණ නියෝග ලබා දී තිබූ අක්කර 16 ක ප්‍රමාණය වගා කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී අදාළ ඉඩම් වගා නොකළ ගොවීන් වෙත නැවත නඩු පැවරීමට කටයුතු කරමි. | එම කුඹුරු ඉඩම් අක්කර 16ක ප්‍රමාණය වගා කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය. |
| (ii) | 53 (1) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 14 කට අදාලව 2020 සිට 2022 දක්වා කුඹුරු ඉඩම් නාම ලේඛන සංශෝධනය සඳහා අයදුම්පත් 2280 ක් ලැබී තිබුණ ද සංශෝධන සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත්තේ අයදුම්පත් 1600 ක් පමණි. | ඉදිරියේදී සංශෝධනය කිරීමට කටයුතු කරමි. | අවශ්‍ය සංශෝධන කඩිනමින් සිදුකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 56 (4) වගන්තිය | වටිනාකම රු.4,672,144 ක් වූ අක්කර බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයන් සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව කාරක සභා 02 ක් විසින් කටයුතු කර නොතිබුණි. පැහැර හරින්නන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>-------------------- | | | |
| (i) | මු.රෙ. 110 | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන යාමට එකඟ වෙමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මු.රෙ.316 | රජයේ මුදල් සහ මූල්‍ය වටිනාකම් දැක්වෙන පත්‍රිකා සහ පෝරම භාවිතා කරන ආයතන විසින් එම මුදල් හෝ පත්‍රිකා සුරක්ෂිතව සේප්පුවක හෝ ආරක්ෂක පෙට්ටියක හෝ ආරක්ෂක කාමරයක තැන්පත් කොට තැබිය යුතු වුවත්, මහඔය හා මඩානගම ගොවි බැංකු විසින් එසේ කටයුතු කර නොතිබුණි. | මඩානගම<br>මධ්‍යස්ථානයේ පවතින ඉඩ පහසුකම් අනුව ආරක්ෂිත ඉබි යතුරු දමා ආරක්ෂාකාරීව ඇති බවත් ඉදිරියේදී තව දුරටත් ආරක්ෂාකාරීව පවත්වාගෙන යාම සඳහා කටයුතු කරමි.<br><br>මහඔය<br>එකඟ වෙමි.<br>ඉදිරි වර්ෂයේ දී නිවරදිව කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් චක්‍රලේඛ හා ලිපි<br>-------------------- | | | |
| (i) | 1981 ඔක්තෝම්බර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛය | | | |
| | 17(3) (ඊ) | මිලට ගත් බඩු තොග පොත්වල ඇතුළත් කර භාරගත් බවට තොග භාරව සිටින නිලධාරියා විසින් කරනු ලබන සහතිකයක් වවුචරයට ඇතුලත් කර තොග පොතේ පිටු අංකය වවුචරයේ | හිඟුරාණ<br>පිළිතුරු සපයා නොමැත.<br><br>මඩානගම | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සටහන් කළ යුතු වුවද, කාරක සභා 3 කට අදාලව බඩ ඉරිඟු වගාව සඳහා රසායනික පොහොර මිලදීගැනීම වෙනුවෙන් සකස් කරන ලද රු.70,487,891 ක් වටිනා ගෙවීම් වවුචර් පත්වල එලෙස තොග පොතේ පිටු අංක සටහන් කර නොතිබුණි. | එකඟ වේ. 2023 වර්ෂයේ නිවැරදි කරමි.<br><br><u>මායාදුන්න</u><br>මිලට ගත් බඩු තොග පොත් වල ඇතුලක් කර භාර ගත් බවට සහතික කර වවුචරයට ඇතලත් කර නොතිබීම හා දක්වා තිබූ කරුණු පිළිගන්නා බවත් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බවත් දන්වා සිටිමි. | |
| 18 (5) ඡේදය | ගොවිජන සේවා කාරක සභාවේ ලේකම්වරයා විසින් අවම වශයෙන් මාසයකට දෙවරක් මුදල් පොත පරික්ෂා කර එහි නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත් වූ බවට අත්සන් තැබිය යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. 2023 වර්ෂයේ නිවැරදි කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| 21(2) ඡේදය | ගොවිජන සේවා කාරක සභාවේ විධායක ලේකම්වරයා විසින් අවම වශයෙන් දෙසතියකට වරක්වත් තොග පොත් පරීක්ෂා කර එහි ඇතුළත් කර ඇති කරුණු නිවැරදි බවට සෑහීමකට පත් වී ඒවායේ ඔහු විසින් අත්සන් කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| 30 (2) ඡේදය | වත්කම් හා ණය ශේෂ සනාථ කිරීම සඳහා ණයකරුවන්ගෙන් හා ණය හිමියන්ගෙන් තහවුරු කිරීම් සහතික ලබාගත යුතු වුවද, එම තහවුරු කිරීම් සහතික ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| 2020 ජුනි 25 දිනැති හා අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් චක්‍රලේඛය | ගොවිජන සංවර්ධන නිලධාරින් 10 දෙනෙකු, ගොවිජන සේවා කාරක සභාවේ ලිපිකරුවන් 11 දෙනෙකු හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 108 දෙනෙකු ඇප | අදාළ නිලධාරීන් සඳහා ඇප තැන්පතු මුදල් තැබීමට ඉදිරියේ දී කටයුතු කරමි. | අදාළ ලිපිය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තැබිය යුතු වුවද, ඇප තබා නොතිබුණි. | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 2.6 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 03කට අදාළව රු.788,000 ක වටිනාකමකින් යුතු පරිගණක හා විදුලි ජනන යන්ත්‍ර අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ රහිතව මිලදීගෙන තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට කටයුතු කරමි. | සියලු ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝප-දේශය අනුව සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

අම්පාර දිස්ත්‍රික්කයට අයත් ගොවිජන සේවා කාරක සභා 26කට අදාළව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.25,403,773 ක ලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.21,278,898 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,124,875 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ගොවිජන සේවා කාරක සභාවන්හි ස්ථාවර තැන්පතු පොලී ආදායම ඉහළ යාමත් අක්කර බදු ආදායම හා අනෙක් ආදායම් ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 04කට අදාළ 2021 වර්ෂයේ දී රු.858,476 ක් වියදම් කරමින් නිෂ්පාදනය කර තිබූ කොම්පෝස්ට් පොහොර තොගයක් ගොවීන් වෙත අලෙවි කිරීමකින් තොරව කාරක සභා භූමි තුළ ගොඩගසා තිබුණි. | ඉදිරියේ දී විකිණීමට කටයුතු කරමි. | අවම වශයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා දරන ලද වියදම හෝ ආවරණය වන පරිදි විකිණීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු අම්පාර දිස්ත්‍රික් කාර්යාලය විසින් 2008, 2010 හා 2012 කාල සීමාව තුළ වාරික ගෙවීමේ පදනම මත ලබා දී ඇති අත්ට්‍රැක්ටර් 73 ක් සඳහා 2022 දෙසැම්බර් 31 වන දින වන විට රු.9,992,106 ක මුදලක් අයකර ගත යුතුව පැවතුණි. | හිඟ වාරික මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නා බව කාරුණිකව දන්වමි. | හිඟ වාරික මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 25කට අදාළව වර්ෂ 01 සිට වර්ෂ 32ක කාලපරිච්ඡේදයක් තුළ විවිධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතුව පවතින රු.87,443,659 ක වටිනාකම අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇතැම් ශේෂ සඳහා තොරතුරු නොමැති අතර සොයාගත හැකි ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. | අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 25කට අදාළව වර්ෂ 01 සිට වර්ෂ 26ක කාලපරිච්ඡේදයක් තුළ ඉදිරියට ගෙන එමින් පවතින රු.234,294,532 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියමාර්ග ගෙන නොතිබුණි. | ඇතැම් ශේෂ සඳහා තොරතුරු නොමැති අතර සොයාගත හැකි ශේෂ ඉදිරියේ දී පියවීමට කටයුතු කරමි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පානව ගොවිජන සේවා කාරක සභාවට අදාලව 2019 වර්ෂයේ දී වැඩිමිල පොහොර කි.ග්‍රෑ.427,250 ක් සඳහා ගෙවිය යුතු මුදල රු.3,836,705 ක් වුවද, රු.55,227 ක් වැඩිපුර පොහොර සමාගම වෙත ගෙවා තිබුණ ද එම වැඩිපුර ගෙවන ලද මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. | අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 03ක් යටතේ පවතින වැව් 88ක වැව් ඉවුරු සීමා දෙපස ප්‍රදේශයේ ගොවීන් අනවසරයෙන් පදිංචි වීම හේතුවෙන් වැව් ඉවුරු සකස් කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | අනවසරයෙන් පදිංචි වී ඇති අය සඳහා ඉදිරියේදී නඩු පැවරීමට කටයුතු කරමු. | අනවසර පදිංචිකරුවන් ඉවත්කර වැව් ඉවුරු සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කාරක සභා 02 ක් විසින් 2022/2023 මහ කන්නයේ දී මිලදීගන්නා ලද රු.10,683,500 ක් වටිනා බයෝටීන් හා බයෝ ෆුඩ් වර්ගයේ කාබනික දියර පොහොර තොගයක් ගොවීන් විසින් රැගෙන නොයාම හේතුවෙන් කාරක සභා තුළ ගබඩා කර ඇති අතර ඒවා නැවත අදාළ සමාගම් වෙත හරවා යවා එම සමාගම් වෙත ගෙවිය යුතු ශේෂයන් අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම තොග නැවත භාර ගන්නා ලෙස අදාළ සමාගම් වෙත දැනුවත් කර ඇත. | අදාළ සමාගම් වෙත හරවා යවා එම සමාගම් වෙත ගෙවිය යුතු ශේෂයන් අඩුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2009/2010 මහ කන්නය සඳහා පොහොර ප්‍රවාහන වියදම් ලෙස ගොවිජන සේවා කාරක සභා විසින් ගෙවන ලද රු.1,782,435 ක් එම සේවාව නිවැරදිව ඉටු නොකිරීම මත කාරක සභාව විසින් අදාළ සමාගමින් අයකර ගනිමින් එම වටිනාකම නැවත ගෙවිය යුතු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා තිබුණ ද එම වටිනාකම සම්බන්ධයෙන් වසර 13ක කාලය තුළ වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අවශ්‍ය ගැලපීම් කඩිනමින් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඖ) | වවලකඩේ ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් අබලන් තත්ත්වයට පත්ව ඇති කුඩා වැව් 03 ක් වසර 05කට අධික කාලයක් තිස්සේ වැව් ඉවුරු සකස් කර නැවත ප්‍රතිසංස්කරනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | අදාළ වැව් ප්‍රතිසංස්කරණය කර ගොවීන් වෙත ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (එ) | වී මිලදී ගැනීමේ වැඩ සටහන යටතේ වී මෝල් හිමියන්ට නිකුත් කළ වී වෙනුවෙන් 2013 වර්ෂයේ සිට උහන ගොවිජන සේවා කාරක සභාවට අය විය යුතු රු.1,408,825 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉහත කාරණය සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුවෙමින් පවතී. | අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඒ) | ගොවිජන සේවා කාරක සභාවේ හිටපු ගොවිජන සංවර්ධන නිලධාරියෙකුගෙන් අය විය යුතු ලෙස 2013 වර්ෂයේ සිට ගිණුම් වාර්තාවල රු.240,470 ක වටිනාකමක් සඳහන් වුවද 2017 වර්ෂය තුළ ඔහුගෙන් රු.6,480 ක මුදලක් පමණක් අයකර ගෙන ඇත. | පිළිතුරු සපයා නොමැත. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඔ) | පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවේ හිටපු ලිපිකරුවෙකුගෙන් අය විය යුතු ලෙස 2011 වර්ෂයේ සිට ගිණුම් වාර්තාවල රු.500,226 ක වටිනාකමක් සඳහන් වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් එම මුදල අයකර ගත යුතුව පැවතුණි. | මේ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය අම්පාර මඟින් සිදු කරනු ලැබේ. | අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඕ) | 2022/2023 මහ කන්නය වෙනුවෙන් ගොවීන් වෙත බෙදා හරින ලද පොහොර වෙනුවෙන් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.373,710 ක මුදල 2023 ජුනි 30 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් අය කර ගැනීමට අදාළ නිලධාරීන්ව දැනුවත් කරන ලදී. | හිඟ මුදල් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ක) | 2018 හා 2019 වර්ෂයන්හි දී සීමා සහිත ලංකා පොහොර සමාගම විසින් ගොවිජන සේවා කාරක සභා 14 ක් වෙත ලබා දී ඇති රු.15,649,098 ක් වටිනා සංස්ථා නැමැති දියර පොහොර තොගය කල් ඉකුත්ව තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන කාරක සභා තුළ ගොඩගසා තිබුණි. | මෙම තොග නැවත රැගෙන යන ලෙස අදාළ සමාගම් දැනුවත් කර ඇති අතර මේ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්තුමිය ද දැනුවත් කර ඇත. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ග) | 2022 යල කන්නය වෙනුවෙන් නොමිලේ බෙදාහැරීම සඳහා ගොවිජන සේවා කාරක සභාව වෙත ලැබී තිබුණු ජෛව දියර පොහොර ලීටර් 1544 ක් විගණිත දිනය වන | ජෛව දියර පොහොර සඳහා කමිටු අනුමැතිය ගෙන සමාගම වෙත නැවත භාරදීමට කටයුතු කරමි. | නැවත භාරදීම සඳහා ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විටත් ගබඩාව තුළ රඳවා තිබූ අතර, එම තොගය කල් ඉකුත් වී තිබුණි. | | |
| (ජ) | 2022 යල කන්නය වෙනුවෙන් නොමිලේ බෙදාහැරීම සඳහා ගොවිජන සේවා කාරක සභාව වෙත ලැබී තිබුණු ජෛව දියර පොහොර ලීටර් 4,666 ක් විගණිත දින වන විටත් කාරක සභා භූමිය තුළ එළිමහනේ අව්වට වැස්සට නිරාවරණව නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය වූ අතර ඒවා අදාළ ආයතන වෙත ආපසු යවා නොතිබුණි. | ජෛව දියර පොහොර රැගෙන යන ලෙස අදාළ සමාගම දැනුවත් කර ඇත. | නැවත භාරදීම සඳහා ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ට) | මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු.1,596,304 ක් වටිනා කල් ඉකුත් වූ හා හානි වූ තොග ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ලේඛනවලින් ඉවත් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්තුමියගෙන් ඉල්ලීම් කර ඇත. | නැවත භාරදීම සඳහා ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඩ) | ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂ තුළදී මිලදී ගන්නා ලද රු.129,503 ක වටිනාකමකින් යුතු කල් ඉකුත් වූ කෘෂි රසායන හා පොහොර තොග සම්බන්ධයෙන් විගණිත දිනය වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම කල්ඉකුත් වූ කෘෂිරසායන හා පොහොර 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල සඳහා පොදු 47 ආකෘතිය මඟින් ඉවත් කිරීමට ඉල්ලීම් කර ඇති අතර 2020.06.15 දින සහකාර කොමසාරිස් අම්පාර මඟින් මෙම ද්‍රව්‍ය සම්බන්ධව කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ විමසීම් කර ඇත. | කල් ඉකුත් වූ තොග සැපයුම්කරුවන් වෙත නැවත භාරදීමට ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 08කට අදාළව 2022/2023 මහ කන්නය වෙනුවෙන් ගොවීන් වෙත අක්කරයට රු.4,000 බැගින් ලැබුණු MOP පොහොර සහනාධාරය අක්කර 2,655 ක් සඳහා රු.10,621,000 ක මුදලක් අදාළ ගොවීන් වෙත ලැබී නොතිබුණි. | මෙම සහනාධාරය ගෙවීම සඳහා ගොවීන්ගේ විස්තර සහිත ලේඛනයක් අප කාර්යාලය මඟින් ලබා දී තිබුණ ද ගෙවීම් කරන ලද්දේ දෙපාර්තමේන්තුව මඟින් වේ. | යෝග්‍ය සියලු ප්‍රතිලාභීන් වෙත අදාළ සහනාධාරය ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවට අයත් මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 5268 ක් වුවද, කුඹුරු ඉඩම් නාම ලේඛනයට අක්කර 3364 ක් පමණක් ඇතුළත් කර තිබුණි. | 2023 වර්ෂයේ කුඹුරු ඉඩම් ප්‍රතිශෝධන කටයුතු මෙම දිනවල සිදු කරමින් පවතින අතර එම කටයුතු අවසානයේ විධිමත් ලේඛණයක් සකස් කිරීමේ හැකියාවක් පවතී. | මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කුඹුරු ඉඩම් නාම ලේඛනයට ඇතුළත් කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෝමාරි හා පොතුවිල් ගොවිජන සේවා කාරක සභා දෙක වෙත ලැබී තිබූ රු.8,000,000 ක වටිනාකමකින් යුතු වී ඉසින යන්ත්‍ර 02ක් 2021 වර්ෂයේ සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | පිළිගනිමි. | එම යන්ත්‍ර අදාළ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක් සතු බැග් මහන මැෂින්, තණකොළ කපන මැෂින් හා කොම්පෝස්ට් මැෂින් යනාදි යන්ත්‍රෝපකරණ 09 ක් වසර 02 ක කාල පරිච්ඡේදයක් තුළ භාවිතයට ගෙන නොතිබුණි. | භාවිතයට ගත හැකි අයිතම ඉදිරියේ දී භාවිතයට ගැනීමටත් එසේ නොහැකි අයිතම අපහරණය කිරීමටත් කටයුතු කරමි. | වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | උහන කාරක සභාව භාරයේ පවතින ට්‍රැක්ටර් රථය හා ටේලරය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමකින් තොරව වසර 10 ක සිට කාරක සභා භූමියේ ගාල් කර තිබුණි. | මෙම යන්ත්‍රෝපකරණ විවිධ රාජ්‍ය ආයතන මඟින් ඉල්ලීම් කර ඇති නමුත් රැගෙන යාමට කටයුතු මේ වන තෙක් සිදු කර නොමැති අතර අලුත්වැඩියා කර භාවිතා කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වමි. | වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | වසර 02ක සිට වසර 07ක කාල පරාසයක් තුළ භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවති පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවට අයත් වතුර මෝටර් 09 ක් හා ඡායා පිටපත් යන්ත්‍රය අපහරණය කිරීමට අවශ්‍ය අනුමැතිය ලැබී නොතිබුණි. | මෙහි දක්වා ඇති භාණ්ඩ අක්‍රීය වී ඇති නිසා අබලි භාණ්ඩ ලේඛනයට ඇතුළත් කර 2019 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණ කටයුතු වල දී පොදු 47 ඇතුළත් කර අපහරණය සඳහා ඉල්ලීම් කළ ද වටිනාකම රු.3,000 ට වැඩි බැවින් භාණ්ඩ සමීක්ෂණ කමිටුවට තීරණගත නොහැකි නිසා තවදුරටත් මධ්‍යස්ථානය තුළ පවතී. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ එසේ නොහැකි නම් බාහිර පාර්ශවයන් වෙත අලෙවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පදියතලාව ගොවිජන සේවා කාරක සභාවට අයත් පහත සඳහන් භාවිතා කිරීමට නොහැකි වත්කම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම භාණ්ඩ අලුත්වැඩියා කර සේවයේ යොදවා ලබන ලාභයට වඩා වියදමක් අලුත්වැඩියා කිරීමේ දී සිදුවන අතර, | භාවිතයට ගැනීමට නොහැකි වත්කම් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | - තල 07 දැති නගුල් 01<br>- තල 09 දැති නගුල් 02<br>- තැටි නගුල් 02<br>- කුබෝටා ට්‍රැක්ටරය 01<br>- ගොයම් කපන යන්ත්‍ර 03<br>- ටේලර් 02<br>- වතුර මෝටර් 10 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී පොදු 47 න් අපහරණයට ඉදිරිපත් කර ඇත. | |
| (ඊ) | දෙහිඅත්තකණ්ඩිය කාරක සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 17 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 02 සිට වසර 05කට අධික කාලයක සිට භාවිතා නොකර පවතින බව නිරීක්ෂණය වූ අතර එයින් භාවිතා කළ නොහැකි වාහන හා යන්ත්‍රෝපකරණ වෙන්දේසියේ විකිණීමට හා අලුත්වැඩියා කළ හැකි වාහන හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කර භාවිතා කිරීමට කාරක සභාවේ අවධානය යොමුව නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණයේ දී සෑම වර්ෂයකම පොදු 47 න් වෙන්දේසි කිරීමට ඉල්ලීම් කර ඇත. | වත්කම් අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ එසේ නොහැකි නම් වෙන්දේසි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | මඩානගම ගොවිජන සේවා කාරක සභාව සතු යන්ත්‍රෝපකරණ අයිතම 06 ක් දීර්ඝ කාලයක සිට භාවිතයට නොගෙන මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ රඳවා තිබුණි. | එකඟ වේ. | වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | 2004 වර්ෂයේ අම්පාර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයෙන් පානම ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලැබුණු ග්‍රේවිස් වර්ගයේ වතුර පොම්ප 09 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වර්ෂ 17 කට අධික කාලයක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ තබා තිබුණි. | එකඟ වේ. | වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (එ) | මායාදුන්න කාරක සභාව සතු වතුර පොම්ප 2 ක්, ට්‍රැක්ටර් රොටරියක්, යකඩ කොකු නගුලක්, අත් ට්‍රැක්ටර් ට්‍රේලරයක් සහ JT 0392 ට්‍රේලරයක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අවුරුදු 11 ක පමණ දක්වා කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන කාරක සභා භූමියේ ගාල්කර තිබුණි. | කාරක සභාව සතුව ඇති ප්‍රයෝජනයට නොගෙන ගාල් කර ඇති භාණ්ඩ ටෙන්ඩර් පටිපාටිය යටතේ වෙන්දේසි කිරීමට බලාපොරොත්තු වන බැවින් එම කටයුතු ඉතා ඉක්මනින් සිදු කර එම භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු කරමි. | වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඒ) | මහඔය දිස්ත්‍රික් කාර්යලය විසින් 2004 වර්ෂය තුලදී ලබා දී තිබුණු වතුර | මෙම වතුර මෝටර් 10 අලුත්වැඩියා කර භාවිතයට | වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට |

| | | | |
|---|---|---|---|
| | මෝටර් 10 ක් දීර්ඝ කාලය සිට අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැනීමට නොහැකි තත්ත්වයට හානි වී ඇත. එම නිසා 2022 භාණ්ඩ සමීක්ෂණයේ දී අපහරණය කිරීමට ඉල්ලුම් කර ඇත. | හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඔ) | දිස්ත්‍රික් කාර්යාල හා ගොවිජන සේවා කාරක සභා 14කට අයත් ඉඩම්වල අයිතිය ගොවිජන සේවා කාරක සභා වෙත පවරාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | අයිතිය පවරාගෙන ගිණුම්ගත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවර්ධන නිලධාරී තනතුර සඳහා ගොවිජන සේවා කාරක සභා 10 ක නිලධාරීන් 27 දෙනෙකු හා දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් 19 දෙනෙකු වශයෙන් නිලධාරීන් 46 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. එම පුරප්පාඩු සංඛ්‍යාවෙන් 39 ක ප්‍රමාණය ගොවිජන සේවා කාරක සභා 14 ක සේවයේ යෙදී සිටින අතිරික්ත සේවක සංඛ්‍යාව මඟින් ආවරණය කර ගැනීමට හැකියාව පැවතුණද ඒ සඳහා කටයුතු කර නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | පවතින අතිරික්ත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු පුරවා ගනිමින් ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 29කට අදාලව ඉහත සඳහන් සංවර්ධන නිලධාරී තනතුරු හැර තනතුරු 05 ක් සඳහා නිලධාරීන් 25 කගේ අතිරික්තයක් හා නිලධාරීන් 99 කගේ පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | සේවක මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරන ලද 2022 ජනවාරි 11 දිනැති හා අංක 7/5/12/ගි.වා.පො දරන ලිපිය හා 2018 අංක 19 දරන විගණන පනතෙහි 16 (2) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික | දිස්ත්‍රික් කාර්යාලය වෙත 2023 මාර්තු 31 දිනට ප්‍රථම දිස්ත්‍රික් කාර්යාලය වෙත බාර දී ඇත. | නියමිත දිනට හෝ එදිනට පෙර ගිණුම් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට |

| | |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන 2023 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 27 ක් විසින් දින 58ක ප්‍රමාදයකින් පසුව 2023 මැයි 29 දින මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි. | කටයුතු කළ යුතුය. |

## 5. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 2012/04 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 2.6.2 (vii) ඡේදය අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් විසින් වසමේ ගොවීන් වෙත නිකුත් කර ඇති ණය කලට වේලාවට අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද, එසේ කටයුතු නොකිරීම නිසා ගොවිජන සේවා මධ්‍යස්ථාන 10කට අදාළව 1999 යල කන්නයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.20,186,016 ක කල් පසු වූ ණය මුදලක් අයකර ගත යුතුව පැවතුණි. | කල් පසු වූ ණය මුදලක් අයකර ගත යුතුව පැවතුණ බව දක්වා ඇති නමුත් පැවති හිඟ ණය මුදල් අය කිරීමට අවශ්‍ය නීතිමය හා රාජකාරී කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. | කල්පසු වූ ණය අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | උහන හිටපු කාරක සභා ලිපිකරුගෙන් අයවිය යුතු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති අත ඉතිරි මුදල වන රු.106,247 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | හිටපු මධ්‍යස්ථාන ලිපිකාරිනියගේ අත ඉතිරි මුදල අම්පාර දිස්ත්‍රික් කාර්යාලයෙන් අය කර ඇති අතර පසුව එම මුදල වැරදීමකින් මහා භාණ්ඩාගාරයට යවා ඇති බව ප්‍රකාශ කරන නමුත් මේ දක්වා අප මධ්‍යස්ථාන වෙත ලැබී නොතිබුණි. | හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 1.6 වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය ගොවි ජනතාවගේ ජීවන මට්ටම දියුණු කිරීම උදෙසා ගොවිජන සේවා කාරක සභාවක්ම ගොවි බැංකු ක්‍රමවත්ව පවත්වා ගත යුතු වුවද පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාව විසින් 2009 වර්ෂයෙන් පසු ගොවි ජනතාවගෙන් තැන්පතු මුදල් එක්රැස් කළ ද ණය ලබාදීමක් සිදුකර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ගොවි බැංකුව ක්‍රියාත්මක මට්ටමට ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පදියතලාව ගොවිජන කාරක සභාවේ 2004 සිට 2012 දක්වා කාලය තුල ගොවි බැංකුවේ සේවය කළ නිලධාරීන්ගෙන් අය කල යුතු රු.466,432 ක මුදලක් අය කර ගැනීම 2023 ජූලි 04 වන දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | වගකිව යුතු නිලධාරීන්ගෙන් අදාළ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඉ) | පදියතලාව ගොවිජන කාරක සභාවේ චක්‍රිය අරමුදල් යටතේ 2002 වර්ෂයේ සිට කෘෂිකර්ම අමාත්‍යාංශයට ගෙවිය යුතු රු.740,120 ක වටිනාකම පියවීමටත් එම අරමුදල යටතේ ගොවීන් වෙත නිකුත් කර ඇති රු.578,942 ක් ණය මුදල් අයකර ගැනීමටත් පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | හිඟ ණය අයකර ගනිමින් අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු මුදල් පියවීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඊ) | කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියැලී සිටින සුළු ගොවීන්ගේ ඉතිරිකිරීම් හා ආයෝජන ශක්තිය වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන ගොවිජන බැංකු පිහිටුවා ඇති නමුත් දෙහිඅත්තකණ්ඩිය ගොවිජන කාරක සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි ගොවි පවුල් 10,752 ක ප්‍රමාණයකින් ගොවිජන බැංකුව සමඟ සක්‍රීයව ගනුදෙනු කරන සාමාජිකයින් සංඛ්‍යාව 300 හෙවත් සියයට 3 ක් පමණ ඉතා පහළ අගයක වූ අතර සාමාජිකයින්ගේ සක්‍රීය දායකත්වය ලබාගැනීම සඳහා ප්‍රමාණවත් අවධානය යොමුකර නොතිබුණි. | ගොවිජන බැංකු ප්‍රවර්ධන වැඩසටහන් 2019/2020 වර්ෂයේ සිදු කල අතර නැවතත් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමි. | සාමාජිකයින්ගේ සක්‍රීය දායකත්වය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | කුඩා කණ්ඩායම් පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, ක්‍රියාකාරී කණ්ඩායම් ලෙස පවත්වා ගැනීම, ගොවිජන බැංකුව සමඟ සක්‍රීය ලෙස දායක කර ගැනීම, සාමාජිකයින්ගේ අරමුදල් ආරම්භ කර වර්ධනය කිරීම හා මෙහෙයවීම වසම් භාර කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ වගකීම වුවත් දෙහිඅත්තකණ්ඩිය ගොවිජන බැංකුවේ සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කුඩා කණ්ඩායම් 42 කින් තැන්පත් මුදල් ලෙස රු.74,000 ක මුදලක් පමණක් රැස්කර තිබූ අතර එය ඉතා පහළ අගයක් විය. | 2022.12.31 දිනට රු.542,377 ක ශේෂයක් පවතින අතර ණය ලබා ගැනීමට අපේක්ෂිත කුඩා කණ්ඩායම් ප්‍රමාණය වැඩි කිරීමත් තැන්පත් වැඩි කිරීමටත් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ දායකත්වය හරහා කටයුතු කරමි. | තැන්පතු ප්‍රවර්ධනය සඳහා කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 1.6 වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය ගොවි ජනතාවගේ ජීවන මට්ටම දියුණු කිරීම උදෙසා සෑම ගොවිජන මධ්‍යස්ථානයක්ම ගොවි බැංකු ක්‍රමවත්ව පවත්වා ගත යුතු වුවද නාමල්තලාව ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් 2003 වර්ෂයෙන් පසු ගොවි ජනතාවට ණය ලබාදීමක් සිදුකර නොමැති අතර සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගොවි බැංකුව අක්‍රීයව පැවති කාලය වර්ෂ 20කට ආසන්නව තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ගොවි බැංකුව සක්‍රීය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |